# නිර්මාණ Nirmana



**රටක් අග මුල නොපෙ-
නෙන දරුණු ව්‍යසනය
කට ගොදුරුව කිසිදු
පිහිටක් නැතිව තනිවූ
කල, ඒ විපතින් රට
බේරාගත් හමුදාවක්
සහ ඊට නායකත්වය දුන්
සෙන්පතියෙකු ගැන
මැතක ලොව කිසිම
රටකින් නැසිමු. එහෙත්
ශ්‍රීලංකාවෙන් එය
අසන්නට ලැබෙන උදාර
තත්වයකට අප දේශය
ගෙන ඒමට නායකත්වය
දුන් ඔබ අපට ඉමහත්
අභිමානයකි.**

## සෙන්පතිඳුන් වෙතටයි

කැතිගා සිහළ මුස්ලිම් හා දෙමළ පුරේ
ඊළම් කොඩිය ඔසවන්නට උතුරු කරේ
ඇඳගෙන කොටි ඇඳුම පිරිබා දමපු හුරේ
ජගතා ඔබයි මොහොතින් සුණු විසුණු කරේ

එඩිබල විකුම් පා අදිටන සිතෙහි තියා
විරු කැළ පිරිවරාගෙන ඉදිරියට ගියා
පෙරටම තැබූ පය ආපසු නොගත් නියා
හෙළ ඉතිහාසයම ඔබෙ නම තබයි ලියා

තිස් වසරක්ම කොටියා එළිපිට නැටුවා
නායකයින් පහක් සිරිලක රජ කෙරුවා
රට ගැන හිතන නායකයෙකු බිහි වූවා
තුන් වසරකින් කොටියගෙ අඩු බඩු කැඩුවා

සුපතල දෙස් විදෙස් හී සිරි ලංකා වේ
තිබුණේ එකම පිළිලය මහ කොටියා වේ
ඊළම බිඳ දමා සිහ දද නැංවූ වේ
හමුදාපති තුමනි ඔබගෙනි එය වූ වේ

ගැමුණු කුමරු යුද්දෙට යන විටදි එදා
අපිළිවෙලට කෑවා තම අහර බෙදා
එදැක මවක් දුන් ඔවදන සිතෙහි රඳා
යුදට සැළසුමක් සැණකින් ගති සාදා

එහෙන් මෙහෙන් නොව පුත බත් පත කෑම
කොණින් කොණට විය යුතු පිළිවෙල සේම
ගැමුණු කුමරු මෙන් සතුරන් කැති ගෑම
කරනා ඔබට පළඳම් මේ මල් දාම

♦ ***චන්ද්‍රා විජේසූරිය***
**Paris France**

## My secret for you !

When April bends above me
And finds me fast asleep
Dust need not keep the secret
A live heart died to keep.

When April tells the thrushes,
The meadow-larks will know,
And pipe the three words lightly
To all the winds that blow.

Above his roof the swallows,
In notes like far-blown rain,
Will tell the little sparrow
Beside his window-pane.

O sparrow, little sparrow,
When I am fast asleep,
Then tell my love the secret
That I have died to keep.

♦ **Sara Teasdale**
(1884 - 1933)

## විශ්‍රාම ගත් පසු

ඉගෙන සිප්සත ළමා වයසෙදි ගුරු දෙගුරු සෙනෙහස ලබන්
තරුණවිය තුළ ලබා රැකියා රිසි විලස දිවි සරු කරන්
සරණ කරගෙන කෙනෙක් දිවියට ගෙවන විට කාලය තුටින්
නොදැන වාගෙම විසුම් ගන්නා දිනය ළං වෙයි සේවයෙන්

සරුව අතමිට තිබෙන කල නෑ මිතුරු කැල ඇත පිරි වරා
ගෙදර දොර කිසි පාළුවක් නැත කෙරෙයි කටයුතු සිත යුරා
කරන සේවය අතර දී නොම දැනේ තනිකම කිසි යුරා
මිතුරු කැල මැද ගෙවෙයි කාලය පිරුණු සොම්නස හද පුරා

දූ පුතුන් ඇති දැඩි කරන්ටත් දියුණ සළසා දෙන්න ටත්
වෙහෙස නොබලා දිවා රෑ මව්පියන් නිතරම දිරි ගනිත්
දෙගුරු විශ්‍රාමිකයි දරුවෝ තුරුණු විය වෙත පා තබත්
මිහිර සොම්නස පතාගෙන උන් වෙන්ව ඇතට පිය නගත්

ළඟාවූ වැඩිහිටි වියේ දී ගෙවන්නට කල් සහන යෙන්
සිතා සිටියත් කෙනෙක් නිතරම එද්දි සමුගෙන සේව යෙන්
සමාජය තුළ තිබෙන නෙයෙකුත් ගැටළු ගැන සිතමින් දුකින්
ගෙවා ගන්නයි වෙන්නෙ ගත සිත දෙකම දුබලව ඇති බැවින්

දුබල වයසෙදි පිහිට වන්නේ කළණ මිතුරන් පමණ කී
එවන් කරුණා ගුණෙන් යුතු අය ඇත්තෙ ලොව අතලොස්ස කී
උපන් කාටත් දිවිය අවසන් අදියරේ දී නොව සැකී
දැනෙයි රුදු වේදනා ගත සිත දෙකට ඉවසිය නොම හැකී

එබව දැනගෙන හොඳට සවිබල තිබෙන කාලෙදි හැකි ලෙසින්
රටට දැයටත් සමයටත් සේවයක් කළ යුතු වෙයි හොඳින්
අසල්වැසියන් නෑ සියන් හා දුකට පත් අයටත් පෙමින්
පිහිට වූ විට හැකිය අවසන් හුස්ම හෙලනට සහන යෙන්

***විශාමලත් විදුහල්පතිනි -***
♦ ***ප්‍රේමා අදිකාරි***
Morden, Surrey, **UK**

## සැලකර සිටිමි

කලුවර ගලන විට ගහකොළ වසා ගෙන
මෙරු මතුවන්ට වූ මිහිමව පලා ගෙන
සර සර හඬින් යන සියොතුන් බලා ගෙන
අරුමක්සේම සිටියෙමි වැහි පතා ගෙන

මිහිකත මුණගැසී අඹරට නිරන් තර
වැහි නැතිවීම ගැන අපමණ කතන් දර
සිතිජය මායිමේ නැවතී ගිමන් හැර
එනු මැන වළාකුළ මා වෙත පිනෙන් බර

වැහැරුණු කෙසහ අත් පා කඳ විදා ගෙන
වනපති පිරිස නුබ වෙත මුව අයා ගෙන
දෙ ලවන පෙහෙන පමණට අඹ පතා ගෙන
වෙව්ලයි සමීරෙන් මුව නිති හමා යන

පිං පැන්තාලි මග තොට තිබූ සිඳී ඇත
ළිං වෙත යනෙන ලලනා හඬ මැකී යත
ගං හෝ පොකුණු වැලි යට සැඟවිලා ඇත
අංබරුවන්ට පවසට පැන් පවා නැත

අටුකොටු හිස්ය අටුකොස් වත් නිමා වී
ගොටුකොළ මුකුණුවැන්නද පරැඩලා වී
නිල් තණ පළස් මත සුදුවැලි දිගා වී
යල් වැහි කවද පැමිණේදැයි අසා වී

♦ ***මැදමුලනේ සමර අබකොළවැව***
**Sri Lanka**

### වියපත් ගසක ප්‍රකාශය

සෙනෙහෙන් ඇවිත් රහසක් දෙන සව නතට
මඳනල මිතුර මා සිත පෙනුණිද නුඹට
ඉපල් අරටු අතු අත් හිස්වූ දිනට
තනිකම පමණ ලැබෙනුද කාගෙන් පිහිට

♦ ***අතුල පී. මල්ලවාරච්චි*** **Sri Lanka**

## මට හිතෙන්නෙ

තුරුහිස් මල් පුබුදුවන්නෙ
ලෝකය පැහැපත් කරන්න
සුළං රැල්ල හෙමින් එන්නෙ
ලොවේ සිසිල උපදවන්න
පොළව පලා ජලය එන්නෙ
මිහිකත සිහිතල කරන්න

සියොතුන් නද පතුරුවන්නෙ
සංගීතය ඇතිකරන්න
පළතුරු පැහිලා ඉදෙන්නෙ
රසවත් බව ලොවට දෙන්න
හඳවත් පිරුණොත් සෙනෙහෙන්
අන් අය වෙත මෙත් වඩන්න
සිත සිහිලෙන් පිරී ගියොත්
වටපිට සුසුමුදු කරන්න
සොබාදහම අඳුරගන්න
ලොව සුන්දරදැයි බලන්න
පරිසරයට එකතුවන්න
සිත සැනසේදැයි බලන්න
ලොව පවතින සොඳුරු ගතිය
සොබා දහමෙ සුසුදු වරුණ
ඇති සැටියෙන් රසවිඳින්න
ඒ හැම හා මිතුරුවන්න

♦ ***මධුරි අබේවික්‍රම***
**Harrow UK**

## සුරංගනා

සඳළුතලා හඳෙහි උපන්
රන්පැහැ ආලේප සිනා
කඳුළු ගැටුණු යුගයක අප
මහපොළවටහොරෙන් ගෙනා
සෙනෙහස දියකර ඉසිනා
මලෙන් උපන් සුරංගනා
සරා සිහින අහස් ගඟේ
තරු මීදුම් මත කළඹා
නුරා හැඟුම් සඟවා නෙත්
පුදසුන් මත පහන් තබා
පතුරා මුතු සිතක පබළු
පොටක් විසිරී විට සුලබා
අසුරා එකිනෙක කඳුළින්
තැනූ අහස් මැදුර සොබා
කර විවර සිතක පෙම්තිර
කරළිය රංගනාවියේ
කවර දෙසින් වැඩියෙද
පොළවට දේවතාවියේ
මුලු සසර තබා සුසුමක
පිබිදුණු මල් මනාලියේ
දුරක නොසිට බෝකල්
මෙපුර වඩින් ප්‍රභාවියේ

♦ ***මහින්ද ප්‍රසාද් මස්ඇඹුල***
ගොඩකවෙල ***Sri Lanka***

## ඔබ නැති දා

සිටී සතුරා කොතැන හෝ
සැඟව දැල්වූ දෑසින්
ඔබ දැන හිඳී ඒ වග
සිටී විපරම් බැල්මෙන්
නොතකා කුසගිනි පිපාසා
ඔබ ගෙවන හැම මොහොතක්
අනතුරු ඔබට අත වනයි
සෙවනැල්ලත් වෙයි සැකයක්

ඉර පායයි එය බැස යයි
දින ගෙවෙයි සති මාසත්
ලෝකය දුව යයි වෙයින්
එහෙත් ඔබ නැත වෙනසක්
නොගනී කිසි ඉස්පාසුවක්
විරාමයක් විනෝදයක් මඳක්
එය නම් මහාම පුදුමයක් !

නසා සතුරන් නුදුරු දින
නැගෙත නුබ සිහ ධජයන්
ගෙනෙයි සිත අබිමන්
කිව නොහැකි වචනයෙන්

නැතිවි නම් ඔබ විරුවන්
කෝ ලකට පිළිසරණක්
කෝ දැයට රැකවරණක්

♦ ***ශ්‍යාමලී තෙබුවන***
**Nice - France**

## ඇත්ත

දුරින් දකින රුව
සිතින් පතන්නේ
ළඟින් හිඳින සඳ
සුසුම් නැගෙන්නේ

සිතින් වින්ද සුව
ගතින් නොදෙන්නේ
මුවින් නැගෙන සර
සවන් පෙළන්නේ

♦ ***රාජේන්ද්‍ර බණ්ඩා***
**Sri Lanka**

## නොදැන සිටින නංගියේ

**සතුරන්ගේ මර උගුල
මගේ දෙපා නැති කළ
දැන් වසරක් ගතවෙලා
ඇයත් මට පිටුපාලා
සති තුනක් පසුවෙලා
නුඹ මේවා දන්නෙ නෑ**

**මගේ මංගල දිනට
එවු මිරිවැඩි සඟල
මම කෙසේ පළඳින්නද
මම කොහොම පවසන්නද**

♦ ***ප්‍රියන්ති අබේනායක***
**Paris France**

## එකම හිනයක හිඳිනට වරෙන්නේ .....!

රන් වැටකින් වටවී ඇති පින්බිමේ
වියරු සැහැසිකම් දුරලා මිතුරනේ
එකම ධජය සෙවනැල්ලේ සැනසිල්ලේ
සැතපෙන්නට පත්කඩ එළමුද දෙරණේ

හතවත යට ගිනිගන්නා පවිටු හැඟුම්
දෙපිළ බෙදී දෙපසට වී හඬන හැඩුම්
ළයෙහි හොවා දරු හැදුවේ එකලෙස නම්
ලේ ගංගා සදා කුමට දෝ මායිම්

ළයෙහි රුහිරු එක ලෙස නම් දිවෙන්නේ
ජාතිය කෙළෙසක නම් වැට බඳින්නේ
මිනිසා මිනිසාට කිම වෙඩි බිඳින්නේ
එකම හීනයක හිඳිනට වරෙන්නේ

බෙදා කඩා ඉපැදුණු දේශය අපගේ
කුමකට දෙපිළක හිඳ ගිනිදැල් අතරේ
වරද කිමැයි සිතුවොත් මිනිසුන් විලසේ
මව්බිම සාමයේ සුවඳින් කිරී ඉතිරේ

♦ ***ධම්මි විජේසිංහ***
Mississague **Canada**

### සාංකා

සිත ඇතුළට ඇවිත් මා නිදි නැති රැයක
අවදිව තැබූ පවසා රහසින් නොයෙක
රසබස් ලියා තබනට නැතිවිය මතක
දුක්වෙමි නොඒදැයි යළි දකිනට දිනක

♦ **DAREN - London NW3**

## Lost in Prime Time

**The red carpet stretches
North, south, east, west.
Weaved with the sinews,
Dyed with the blood,
Seasoned with the sweat,
Cleansed with the tears,
Of the countless
fallen so young.**

**United they died,
Divided we live.
For unity they died,
For division we live.
United they rest,
Divided we drift.**

**Fulfill that dream -
- A life in unity -
The fallen couldn't live.**

♦ **F. J. Silva**
**Netherlands**

## හිත මිතුරු

රාත්‍රිය නුඹ නිදිවරා
තනි රකින සඳ නෙත් විදා
කඳුල දුර සිට ඉහිමරයි
කොහේදෝ ගිය සිත සොයයි

කලුව දුක්බර ගීතයක් වී
රැය සමග අත්වැල් බඳී
වවුල් සිතුවිලි රැහැන් බිඳ යයි
මීදුමක් වී පා වෙවී

එළිවෙලා සිත මවෙත එනතුරු
ගුලිවෙලා මෙහි හිඳින්නම්
මදෙස බලමින් සොවින් නොතැවී
රාත්‍රිය නුඹ සැතැපියන්

♦ ***ශ්‍රියා කුමාරසිංහ***
Dunedin
**New Zealand**

## නුඹයි අම්මේ දිරිය!

නෙත් පියන් විවරකර ලෝකයම දකින්නට
නොමිනිසුන් අතර මැද යහගුණෙන් වැඩෙන්නට
ආදරය කරුණාව ලෝකයට බෙදන්නට
නුඹයි දුන්නේ සවිය හෙට ලොවම දිනන්නට

අඳුරු තිර පට ඉරා සඳක් සේ දිලෙන්නට
දිවි මගේ කම්කටොළු සම සිතින් දරන්නට
දුක් කඳුළු පිසදමා සිනාසී හිඳින්නට
නුඹයි අම්මේ දිරිය ජීවිතය විඳින්නට

නුඹේ සෙනෙහස තරම් සිතම සුව කරන්නට
නොදුටුවෙමි සෙනෙහසක් තුන් සිතම නිවන්නට
මගේ ආයුත් අරන් සදාකල් රැඳෙන්නට
ඔබේ පා යුග වඳිමි මව්නි ණය ගෙවන්නට

♦ ***ප්‍රියංවදා ජයමාල***
**මුවගම - රත්නපුරය Sri Lanka**

## බිඳී විසිරුණු සිහින මන්දිර

සුදු අරලියා ගස් ඇති ගෙමිදුලක මැද
ලැබූ ඔබ පහස මඳ සුළඟේ මිහිර විඳ
තනිවී අප දෙදෙන අද දෙපසකට වැද
රජවී තිබෙන පාළුව ගැන කියමි හද

ඔබ ගැන පියේ මතකය හද නැගෙන විට
දෙනෙතින් ගලා යනවා උණු කඳුළු කැට
හීනෙන්වත් නොපෙනිලා ඉන්නට රැට
වෙන් වී යන්න කළ පව් කියනවද මට

ඔබ නිවහනට අප ආ ඒ දිනේ සිට
නැත මට වචන විඳි සොම්නස කියන් නට
දෙරටක සිටියදිත් හැම දින කතා කොට
අමතක කළේ නැහැ පුතු ගැන අහන් නට

සිටවූ පිච්ච වැල මිදුලේ සුදු පාට
මල්වල සුවඳ ගෙට එනවද වැහි දාට
තරු පිරිවරා ගෙන එන සඳරැස් රැට
තනි රකිනව නොවෙද අද මම නැති වාට

අප මැව් සිහින මන්දිර හෙට දවස ගැන
එකිනෙක බිඳී ගියෙ සුළඟට ගසා ගෙන
ඔබ සැදූ බුදු පහන නිවසට එළිය දෙන
අදටත් පහන දැල්වෙනවද කියනු මැන

♦ ***තුෂාරා එස්. පෙරේරා***
**Nicosia - Cyprus**

***මෙම නිර්මාණ පිටුවේ පළකිරීම සඳහා ඔබ ලියූ දීර්ඝ නොවන කෙටි පද්‍ය පංති අපට එවන්න.***